# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 2014 අංක 17 දරන බෞද්ධ සිද්ධස්ථාන පුනරුත්ථාපනය කිරීමේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත

**[සහතිකය සටහන් කළේ 2014 අප්‍රේල් මස 24 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.


2014 අප්‍රේල් මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 11.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 10.00 යි.

## 2014 අංක 17 දරන බෞද්ධ සිද්ධස්ථාන පුනරුත්ථාපනය කිරීමේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2014 අප්‍රේල් මස 24 වැනි දින]

එල්.ඩී.ඕ. (අයි.එන්.සී.)15/2010.

### බෞද්ධ සිද්ධස්ථාන පුනරුත්ථාපනය කිරීමේ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"බෞද්ධ සිද්ධස්ථාන පුනරුත්ථාපනය කිරීමේ පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වී ඇති රීතිවලට අනුකූලව එකී පදනම සම්බන්ධව සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එකී පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩදීම යෝග්‍ය වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2014 අංක 17 දරන බෞද්ධ සිද්ධස්ථාන පුනරුත්ථාපනය කිරීමේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

බෞද්ධ සිද්ධස්ථාන පුනරුත්ථාපනය කිරීමේ පදනම සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට හා ඉන් පසු, (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) බෞද්ධ සිද්ධස්ථාන පුනරුත්ථාපනය කිරීමේ පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් ද, බෞද්ධ සිද්ධස්ථාන පුනරුත්ථාපනය කිරීමේ පදනම යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

2–PL 004916—2,200 (2010/06)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) මූල්‍යමය දුෂ්කරතාවලට මුහුණ දී ඇති විහාරස්ථාන විසින් සන්තකය දරනු ලබන්නාවූ ද, පුනරුත්ථාපනය කිරීම අවශ්‍ය වන්නාවූ ද, එකී විහාරස්ථාන පරිශ්‍ර තුළ පිහිටා ඇති බෞද්ධ විහාරස්ථාන සහ ගොඩනැගිලිවල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා එකී බෞද්ධ විහාරස්ථාන සඳහා මූල්‍යමය සහ වෙනත් ආකාරයේ සහාය ලබාදීම ;

(ආ) ජාතික සහ ආගමික සිරිත් විරිත්වල යෙදීම සහ බෞද්ධාගමික ජීවිතයක් ගත කිරීම සඳහා දිරිගැන්වීම මගින් ප්‍රදේශයේ බෞද්ධාගමිකයන් අතර අධ්‍යාත්මික ගුණ වගාව පෝෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ; සහ

(ඇ) අදහස් සහ පළපුරුද්ද හුවමාරු කර ගැනීම සූසාධනය කිරීමේ අදහස ඇතිව, සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු ඇති ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම මේ පනතේ විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරාපත් කරගනු ලබන්නා වූ සභාපතිවරයකු, ලේකම්වරයකු, භාණ්ඩාගාරිකවරයකු සහ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන හෝ පත් කර ගනු ලබන තවත් සාමාජිකයන් යම් සංඛ්‍යාවකින් සමන්විත වූ, (මෙහි මින් මතු කමිටුව යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ) කළමනාකරණ කමිටුවක් මගින් පාලනය වන්නේ ය.

(2) සංස්ථාවේ ප්‍රථම කමිටුව මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ කමිටුවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු අතර, ඔවුන්, 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව අලුත් කමිටුවක් පත් කරනු ලබන තෙක් නොකඩවා ධුර දැරිය යුතු ය.

(3) කමිටුවේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක්, හුදෙක් එහි සාමාජිකයන්ගේ පුරප්පාඩුවක් තිබීම හෝ එහි යම් සාමාජිකයකු නම් කිරීම හෝ තෝරාපත් කර ගැනීමේ යම් දෝෂයක් තිබුණු පමණින් අවලංගු සේ නොසැලකිය යුතු ය.

**5.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට පහත සඳහන් බලතල ඇතතේ ය :— සංස්ථාවේ බලතල.

(අ) ශ්‍රී ලංකාවේ හෝ විදේශීය තැනැත්තන්ගෙන් හෝ සංවිධානවලින් මුදල්, ත්‍යාග, පරිත්‍යාග, ප්‍රදාන හෝ වෙනත් යම් ආධාර භාර ගැනීම හෝ එකතු කිරීම :

එසේ වුව ද, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන්, කමිටුව විසින් මුදල් විෂයය පවරා ඇත්තේ යම් අමාත්‍යවරයකු වෙත ද, එම අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ඒ සඳහා ලබා ගත යුතු ය ;

(ආ) කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ හෝ වෙනත් ගිණුම් විවෘත කිරීම සහ ඒවා පවත්වාගෙන යාම ;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි ගිවිසුම් හෝ කොන්ත්‍රාත්වලට සෘජුව හෝ තත්කාර්ය සඳහා සංස්ථාව විසින් බලය පවරනු ලැබූ නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් ඇතුළු වී ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාවේ යෙදවීම ;

(ඈ) සංස්ථාවේ කාර්යය සඳහා මුදල් ණයට ගැනීම හෝ අරමුදල් සපයා ගැනීම ;

(ඉ) කමිටුව විසින් අනුමත කරනු ලබන යම් ආයතනයක සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් හෝ සඳහා, කලින් කල, සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ නෙරපීම ;

(ආ) කමිටුවේ සාමාජිකයන් තෝරාපත් කර ගැනීම හෝ පත්කර ගැනීම, ඔවුන්ගේ බලතල, කාර්යය, කර්තව්‍ය සහ ධුර කාලය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය ;

(ඈ) කමිටුවේ රැස්වීම කැඳවීම, රැස්වීම් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය, ඒ රැස්වීම් පවත්වන වේලාව, ස්ථානය, ඒ රැස්වීම්වල දැන්වීම්, න්‍යාය පත්‍රය සහ ඒ සඳහා ගණපූරණ මෙන්ම ඒවායෙහි කටයුතු පවත්වාගෙන යාම ;

(ඉ) සංස්ථාවේ දේපළ කළමනාකරණය එහි අරමුදල්වල භාරකාරත්වය සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලබන සෑම රීතියක්ම (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් ම එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පරිත්‍යාග, දායක මුදල්, සම්මාදම්, ගාස්තු හෝ ප්‍රදාන හෝ මූල්‍ය ආයෝජන වශයෙන් මීට පෙර ලැබුණු හෝ මින්මතු සංස්ථාවට ලැබෙන සියලු මුදල් (මෙහි මින්මතු "අරමුදල"

යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, එම අරමුදල කමිටුව විසින් තීරණය කරනු ලබන යම් බැංකුවක හෝ බැංකුවල පවත්වාගෙන යා යුතු ය.

(2) පහත සඳහන් මුදල් සංස්ථාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය :—

(අ) සංස්ථාව වෙනුවෙන් භාරගනු ලබන සහ එකතු කරනු ලබන ත්‍යාග, පරිත්‍යාග, සම්මාදම් මුදල් හෝ වෙනත් ආකාරයකින් රැස්කරගනු ලබන සම්මාදම්, දායක මුදල්, ගාස්තු, ප්‍රදාන හෝ මූල්‍යමය ආයෝජනවලින් ලැබෙන ලාභ ;

(ආ) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය ඉටු කිරීමේ දී සංස්ථාව වෙත ලැබෙන සියලු මුදල් ;

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ප්‍රභවයන්ගෙන් ලැබෙන ණය, ප්‍රදාන හෝ ත්‍යාග වශයෙන් සංස්ථාවට ලැබෙන සියලු මුදල්.

(3) සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**8.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් යම් චංචල සහ නිශ්චල දේපල අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එම සියලු දේපල විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව සංස්ථාවේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපල දැරිය යුතු ය.

මුදල් සහ දේපල අදාළ කර ගැනීම.

**9.** සංස්ථාවේ මුදල් හා දේපළ, මෙහි දක්වා ඇති සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර, එහි කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන් වෙත සෘජුවම හෝ වක්‍රව ලාභාංශ, ප්‍රසාද, දීමනා, ලාභ හෝ වෙනත් යම් ආකාරයකින් ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය.

ගිණුම් විගණනය.

**10.** (1) සංස්ථාව විසින් එහි ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**11.** (1) සංස්ථාවේ මුද්‍රාව කමිටුව විසින්, නිශ්චය කරනු ලබන තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු අතර, එය කමිටුව විසින් නිශ්චය කරනු ලබන ආකාරයට, කලින් කල වෙනස් කළ හැකි ය.

(2) තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් යම් සාධන පත්‍රයක තම නම් අත්සන් කළ යුතු, කමිටුවේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.

**12.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරිවුවහොත්, එම දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායම් හෝ දේපළ ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් එවැනි ආයතනයකට හෝ ආයතනවලට එම දේපළ දීම හෝ පැවරීම කළ යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ විසුරුවා හැරීමට පෙර සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන නිශ්චය කළ යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ යම් සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.